ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. නීති උපදේශක තනතුර (කොන්ත්‍රාත් පදනම)

අ) යෝග්‍යතාවය

නීතිඥයකු වීම සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීති උපාධියක් ලබා තිබීම

සමඟ

පළපුරුද්ද

පිළිගත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක නීති ක්ෂේත්‍රයේ සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වේ.

සටහන I :

ඉංග්‍රීසි හා සිංහල / දෙමළ මාධ්‍යයෙන් සේවයේ යෙදීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස බලපත්‍රයක් ලබා තිබීම

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 1 (SLM 1) |
| ආරම්භක වැටුප | : | රු. 75,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,900/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 125,000/= ක් පමණ වේ.

ඇ) ප්‍රතිලාභ

වරාය අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් (ඉන්ධන), නිල නිවස, වෛද්‍ය පහසුකම්, දුරකථන / ජංගම සමග අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

සටහන II :

තෝරාගනු ලබන අයදුම්කරු නාවික හා වරාය සම්බන්ධ කටයුතු සහ වාණිජ නීතිය, කාර්මික නීතිය සහ කම්කරු නීතිය ඇතුළුව සියළුම නීතිමය කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපදෙස් දීම අවශ්‍ය කෙරෙන අතර, අධිකාරියට අවශ්‍ය අවස්ථාවන්හි අධිකරණයේ පෙනී සිටිය යුතු යි. කෙටි දැනුම් දීමකදී අධිකාරියට සිය සේවය ලබා දීමට අයදුම්කරුට හැකි විය යුතු අතර, වේගවත්ව වෙනස් වන සුළු වාතාවරණයන් යටතේ නීති සේවාවන් එහි උපරිම කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා නීති කොට්ඨාශය අධීක්ෂණය කළ යුතු වේ.

02 .... පිටුවට

**2. <u>වෛද්‍ය නිලධාරි තනතුර (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 3)</u>**

අ) යෝග්‍යතාවය

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් **MBBS** උපාධිය හෝ ඒ හා සමාන උපාධියක් සමඟ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස ලියාපදිංචි වී සිටීම.

සමඟ

පළපුරුද්ද

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවේ රජයේ හෝ පෞද්ගලික රෝහලක වෛද්‍ය නිලධාරියෙකු ලෙස වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වේ.

කාර්මික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කර ඇති වෛද්‍යවරුන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 61,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,555/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. **111,000/=** ක් පමණ වේ.

සටහන **I :**

තෝරාගනු ලබන අයදුම්කරුවන් හට අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් සමඟ අනෙකුත් ප්‍රතිලාභද හිමි වේ.

සටහන **II :**

සේවා අවශ්‍යතාවය මත පිරිමි අපේක්ෂකයින් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**3. <u>නාවික නියමු තනතුර (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 3)</u>**

අ) යෝග්‍යතාවය

නෞකාවක යාත්‍රාපතිවරයෙකු (සීමාරහිත) වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත්කරනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සමඟ

පළපුරුද්ද

විදේශ වෙළඳ නෞකාවක යාත්‍රාපතිවරයෙකු ලෙස අවම වශයෙන් වසර එක (01) ක මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම

03.... පිටුවට

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 61,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,555/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. **111,000/=** ක් පමණ වේ.

**4.** ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම 3)

අ) යෝග්‍යතාවය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ / සහතික ලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ පූර්ණ සාමාජිකත්වය සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් ලබා තිබීම.

සමඟ

පළපුරුද්ද

අදාළ ක්ෂෙත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 61,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,555/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. **111,000/=** ක් පමණ වේ.

**5.** ජ්‍යෙෂ්ඨ වරාය නිරාපද නිලධාරි තනතුර (මධ්‍යම කළමනාකරන මට්ටම 1)

අ) යෝග්‍යතාවය

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයක් සහිත විද්‍යාවේදී උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් සමඟ ජාතික වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ආයතනය (NIOSH) මගින් ලබාගත් වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම්.

සමඟ

පළපුරුද්ද

අදාළ ක්ෂෙත්‍රයේ සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 1 (MLM 1) |
| ආරම්භක වැටුප | : | රු. 53,000/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,380/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. **102,500/=** ක් පමණ වේ.

04 .......පිටුවට

**6.** <u>ඉංජිනේරු (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික) තනතුර (මධ්‍යම කළමනාකරණ මට්ටම 1)</u>

අ) යෝග්‍යතාවය

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාවේදී (සිවිල්/ විදුලි / යාන්ත්‍රික) උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ලබා ගන්නා ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 1 (MLM 1) |
| ආරම්භක වැටුප | : | රු. 53,000/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,380/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 102,500/= ක් පමණ වේ.

**7** <u>ප්‍රධාන මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරි තනතුර (මධ්‍යම කළමනාකරණ මට්ටම 2)</u>

අ) යෝග්‍යතාවය

දළ බර ටොන් 500 කට නොඅඩු වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නාවික සුපරීක්ෂණ නිලධාරියෙක් ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

සමඟ

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය (Radar Observers Certificate) සමඟ ඉහළ තරංග ආයාම (VHF) සහ ගුවන්විදුලි සන්නිවේදනය (RT) පිළිබඳව පුළුල් දැනුමක් සහ චතුර ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව පැවතිය යුතුය.

සමඟ

පළපුරුද්ද

අදාළ ක්ෂෙත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 2 (MLM 2) |
| ආරම්භක වැටුප | : | රු. 50,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,265/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 100,000/= ක් පමණ වේ.

සටහන

යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා පෙනීමකින් හා ශ්‍රවණයකින් යුත් පුද්ගලයෙක් විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

05.....පිටුවට

08) <u>යාත්‍රාපති (ගිනි නිවන යාත්‍රාව) තනතුර – (මධ්‍යම කළමනාකරණ මට්ටම 2)</u>

අ) යෝග්‍යතාවය

දළ බර ටොන් 3000 කට නොඅඩු වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල යාත්‍රාපතිවරයෙකු ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

හෝ

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ වෙනත් උසස් මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සමඟ

පළපුරුද්ද

වසර දෙක (02) ක අදාළ මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම.

ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 2 (MLM 2) |
| ආරම්භක වැටුප | : | රු. 50,500/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,265/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 100,000/= ක් පමණ වේ.

09) <u>අතිරේක ප්‍රධාන මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරි තනතුර (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම)</u>

අ) යෝග්‍යතාවය

දළ බර ටොන් 500 කට නොඅඩු වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නාවික සුපරීක්ෂණ නිලධාරියෙක් ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

සමඟ

අධ්‍යක්ෂ (වෙළඳ නැව්) විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය (Radar Observers Certificate) සමඟ ඉහළ තරංග ආයාම (VHF) සහ ගුවන්විදුලි සන්නිවේදනය (RT) පිළිබඳව පුළුල් දැනුමක් සහ චතුර ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව පැවතිය යුතුය.

සමඟ

පළපුරුද්ද

අදාළ ක්ෂෙත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

06.......පිටුවට

ආ) වැටුප

වැටුප් කාණ්ඩය : 5 : (JLM )

ආරම්භක වැටුප : රු. 48,000/-

වාර්ෂික වැටුප් වර්ධකය : රු. 1,150/-

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 97,500/= ක් පමණ වේ.

සටහන

යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා පෙනීමකින් හා ශ්‍රවණයකින් යුත් පුද්ගලයෙක් විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

10. <u>ඉංජිනේරු නිලධාරි තනතුර (ටග් හා මේසා යාත්‍රා)</u>

(අ) යෝග්‍යතාවය

01. i. අ.පො.ස (උ.පෙළ) විභාගයේදී එකවර විෂයන් තුන (03) කින් සමත් වීම.

සහ

ii. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (HNDT) / ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) / ජාතික විද්‍යා ඉංජිනේරු තාක්ෂණික ඩිප්ලෝමාව (NDES) / ඉංජිනේරු ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය (ED – OUSL) / ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ සිව් අවුරුදු විශේෂ ආධුනික පාඨමාලාව / පස්වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 5)/ සාගර විශ්ව විද්‍යාලයේ ජාතික නාවික හා ඉංජිනේරු ඩිප්ලෝමාව.

සහ

iii. 3000 KW නොඅඩු යාත්‍රාවක ඉංජිනේරු නිලධාරියෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද

හෝ

02. i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂාව සහ ගණිතය සමඟ විෂයයන් හය (06) කින් සමත්වී තිබීම.

සහ

ii. 750 KW හා 3000 KW යාත්‍රාවක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ වසර පහ (05) ක් එකී යාත්‍රාවක ඉංජිනේරු නිලධාරියෙකු වශයෙන් සේවය කර තිබීම.

ඉහත 01 හෝ 02 යටතේ දක්වා ඇති සුදුසුකම් වලට අමතරව පහත සඳහන් සහතික ලබා තිබිය යුතුය.

01. Certificate of Maritime English.
02. Certificate Course on Personal Safety & Social Responsibility.
03. Certificate Course on Personal Survival Techniques.
04. Certificate Course on General Safety – First Aid.
05. Certificate Course on Fire Prevention & Fire Fighting

(ආ) වැටුප

වැටුප් කාණ්ඩය : 6 : 3 (SG 3)

ආරම්භක වැටුප : රු. 25,700/-

වාර්ෂික වැටුප් වර්ධකය : රු. 920/-

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 75,200/= ක් පමණ වේ.

07...... පිටුවට

සටහන

අවශ්‍ය වුවහොත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත / ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.

**11.** <u>වැඩ අධිකාරි (මහජන සෞඛ්‍ය පරීක්ෂක) තනතුර</u>

(අ) යෝග්‍යතාවය

**01. i.** අ:පො:ස (උ:පෙළ) විභාගයේදී එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම.අ:පො:ස (සා:පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සෞඛ්‍ය විද්‍යාව හෝ විද්‍යාව විෂය සමත් වී තිබිය යුතුය.

සහ

**ii.** මහජන සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය

සහ

**iii** පිළිගත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද

හෝ

**02 i.** අ:පො:ස (සා:පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භාෂාව, සෞඛ්‍ය විද්‍යාව හෝ විද්‍යාව යන විෂයයන් 06 කින් සමත්වීම.

සහ

**ii.** මහජන සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය

සහ

**iii** පිළිගත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු වශයෙන් වසර පහ (05) ක පළපුරුද්ද

(ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 6 : 3 (SG 3) |
| ආරම්භක වැටුප | : | රු. 25,700/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 920/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 75,200/= ක් පමණ වේ.

**12.** <u>විකිරණ ශිල්පී තනතුර</u>

(අ) යෝග්‍යතාවය

**i.** අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම.

සහ

**ii.** ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය

සහ

**iii.** පිළිගත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක විකිරණ ශිල්පියෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද

08...... පිටුවට

(ආ) වැටුප

වැටුප් කාණ්ඩය : 8 : 3 (NT 3)

ආරම්භක වැටුප : රු. 22,825/-

වාර්ෂික වැටුප් වර්ධකය : රු. 635/-

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 72,300/= ක් පමණ වේ.

සටහන:

i. අවශ්‍ය වුවහොත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත / ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.

13. <u>සැලසුම්කරු තනතුර</u>

(අ) යෝග්‍යතාවය

i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ:පො:ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය, භාෂාව ඇතුලුව විෂයන් 06කින් සමත්වී තිබීම.

සහ

ii. රජයේ අනුමත කාර්මික ආයතනයකින් ලබාගත් ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය හෝ හතරවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 4)

සමඟ

iii. සැලසුම්කරුවකු වශයෙන් රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.

සැ.යු. :-අ:පො:ස (උසස් පෙළ) විභාගයේදී ගණිතය හෝ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂය ධාරාව හදාරා ඇති අපේක්ෂකයින් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

(ආ) වැටුප

වැටුප් කාණ්ඩය : 8: 3 (NT 3)

ආරම්භක වැටුප : රු. 22,825/-

වාර්ෂික වැටුප් වර්ධකය : රු. 635/-

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 72,300/= ක් පමණ වේ.

සටහන:

i. අවශ්‍ය වුවහොත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත / ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.

09...... පිටුවට

**14.** <u>මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී තනතුර</u>

(අ) යෝග්‍යතාවය

01. i. අ.පො.ස (උ.පෙළ) විභාගයේදී එකවර විෂයන් තුන (03) කින් සමත් වීම.

සහ

ii. Global Maritime Distress SafetySystem (GMDSS – GENERAL) ප්‍රවීණතා සහතිකය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක් / සිව්වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 4)

හෝ

02. i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී භාෂාව, ගණිතය සමඟ විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනකින් සමත් වීම.

සහ

ii. Global Maritime Distress SafetySystem (GMDSS – GENERAL) ප්‍රවීණතා සහතිකය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක් / සිව්වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 4)

වෙනත් සුදුසුකම්

i. නාවික මුහුදු ගමන් පිළිබඳ (Officer In-charge of navigational watch of less than 500Gt in near Coastal) යෝග්‍යතා සහතිකය
ii. නාවික මුහුදු ගමන් පිළිබඳ (Radar Observer course) යෝග්‍යතා සහතිකය
iii. නාවික මුහුදු ගමන් පිළිබඳ (Deck Officer Class IV/V) යෝග්‍යතා සහතිකය
iv. අධි උච්ච සංඛ්‍යාත පණිවිඩ හුවමාරු උපකරණ (V.H.F) උපයෝගී කර ගනිමින් සංඥා නිකුත් කිරීමේ දැනුම සහිතව ඒ හා සම්බන්ධ මනා හැකියාවක් තිබීම.
v. ඉංග්‍රීසි භාෂාවෙන් චතුරව කථා කිරීමේ හැකියාව

(ආ) වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 8 : 3 ( NT 3) |
| ආරම්භක වැටුප | : | රු. 22,825/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 635/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 72,300/= ක් පමණ වේ.

සටහන:

i. අවශ්‍ය වුවහොත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත / ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.

<u>සැලකිය යුතුයි</u>

ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

10...... පිටුවට

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක/ කොට්ඨාශයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13. යන ලිපිනයට ලැබෙන සේ 2020 - 11 - 20 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (chrm@slpa.lk) එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

සභාපති.